SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education NWP

25A S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# ඉන්දියා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

- **අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් 05 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක්වා සමඟ නොගැලපේ. එම නොගැළපෙන නාමය තෝරා එයට අදාළ අංකය දී ඇති හිස්තැනෙහි ලියන්න.**

01. 1. රාවි 2. බියස් 3. යමුනා 4. සත්ලෙජ් 5. චේනාබ් (.....)
02. 1. ලෝතාල් 2. චන්හුදාරෝ 3. සුක්තජොන්දෝර් 4. තම්බපණ්ණි 5. කලිබන්ඝන් (.....)
03. 1. අංග 2. වත්ස 3. චේදි 4. මල්ල 5. පංචාල (.....)
04. 1. මෝටිමර් විලර් 2. ජෝන් මාෂල් 3. ස්ටුවර්ට් පිගොට් 4. නීලකන්ඩ ශාස්ත්‍රි 5. ආර්.ඩී. බැනර්ජි (.....)
05. 1. භරත 2. පුරු 3. යදු 4. තුර්වාස 5. ශිව (.....)
06. 1. ගම් 2. විශ් 3. ජන 4. පුර 5. සමිති (.....)
07. 1. පුරෝහිත 2. සේනානි 3. විශ්පති 4. ග්‍රාමණී 5. ගෘහ (.....)
08. 1. පෘථිවි 2. අග්නි 3. බ්‍රහස්පති 4. ඉන්ද්‍ර 5. ගංගා (.....)
09. 1. නාසික් 2. කාර්ලේ 3. අජන්තා 4. සාංචි 5. එල්ලෝරා (.....)
10. 1. සාකුන්තලය 2. මේඝ දූතය 3. කාදම්බරී 4. ඍතු සංහාරය 5. රඝු වංශය (.....)

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල පද යුගල 05 බැගින් දී ඇත. ඒවා අතුරින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය තෝරා එයට හිමි අංකය අදාළ හිස්තැනෙහි ලියන්න.**

11. 1. ජාතක කතා පොත - බෞද්ධ ග්‍රන්ථයකි.
    2. භගවතී සූත්‍ර - ජෛන ග්‍රන්ථයකි.
    3. පංච තන්ත්‍රය - ඓතිහාසික ග්‍රන්ථයකි.
    4. මුද්‍රා රාක්ෂය - පුරාණ ග්‍රන්ථයකි.
    5. තෝල්කාප්පියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි. (.....)

12. 1. රාමායනය - වාල්මිකී
    2. මහා භාරතය - ව්‍යාස පඩිවරයා
    3. විෂ්ණු ගුප්ත - අර්ථ ශාස්ත්‍රය
    4. මෙගස්තිනිස් - ඉන්ඩිකා
    5. පාහියං - භ්‍රමණ වෘත්තාන්තය (.....)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

13. 1. මහාවංශ ටීකාව - ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයකි.
2. ටොලමිගේ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශ - ග්‍රීක මූලාශ්‍රයකි.
3. පාහියං හිමිගේ වාර්ථා - චීන මූලාශ්‍රය
4. අල්බිරුණිගේ වාර්ථා - අරාබි මූලාශ්‍රයකි.
5. පත්තුප්පාට්ටු - දෙමළ මූලාශ්‍රයකි. (.....)

14. 1. තාම්‍රලිප්ත - ගංගා ගඟ
2. සුප්පාරක - යමුනා
3. භාරුකච්ච - නර්මදා
4. කාවේරි පටුන - කාවේරි ගඟ
5. මොහෙන්ජොදාරෝ - සින්ධු (.....)

15. 1. හරප්පාවේ - ධාන්‍යාගාරය
2. රඛීගාර්හි - කාර්මික ජනපදය
3. මොහෙන්ජොදාරෝවේ - ස්නානාගාරය
4. ලෝතාල් - ස්වභාවික වරායකි.
5. දොලවීර - හරප්පා ශිෂ්ටාචාරයට අයත් සුළු නගරයකි. (.....)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න සඳහා නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X සහ Y තීරුවේ දී ඇත. එහෙත් Y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන/දින වකවානු X තීරුව සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දී ඇත්තේ අනු පිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමඟ නිවැරදිව ගලපා නිවැරදි වරණය තෝරා හිස්තැනෙහි ලියන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අංග | A | රජගහ |
| 2. | මගධ | B | චම්පා |
| 3. | වජ්ජි | C | කෞෂම්බි |
| 4. | වත්ස | D | ඉන්ද්‍රපුස්ථ |
| 5. | කුරු | E | වේසාලි |

1. ABCDE 2. BAECD 3. BEACD 4. CBAED 5. CEABD (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ඉන්ද්‍ර | A | මරණයට අධිපති |
| 2. | පශුපති | B | සතුන්ට අධිපති |
| 3. | යම | C | යුද්ධයට අධිපති |
| 4. | අග්නි | D | ගින්නට අධිපති |
| 5. | කුවේර | E | ධනයට අධිපති |

1. ABCDE 2. BDECA 3. CBADE 4. CADEB 5. DEABC (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | අශෝක | A | හතිගගුම්ඵා |
| 2. | ඛාරවේල | B | අයිහෝල් |
| 3. | රුද්‍රා දාමන් | C | දිල්ලි - තෝප්‍රා |
| 4. | සමුද්‍රගුප්ත | D | අලහබාද් |
| 5. | II පුලකේශීන් | E | ජුනාගර්ඩ් |

1. ABDCE 2. BDAEC 3. CAEDB 4. DCAED 5. CEADB (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. වසුමිත්‍ර | A | මේඝදූතය |
| | 2. මෙගස්තිනිස් | B | මුද්‍රා රාක්ෂය |
| | 3. කෞටිල්‍ය | C | ඉන්ඩිකා |
| | 4. විශාඛදත්ත | D | අර්ථ ශාස්ත්‍රය |
| | 5. කාලිදාස | E | මහා විභාෂා ශාස්ත්‍ර |

1. ABCDE 2. BACED 3. BCADE 4. ECDBA 5. EDBAC(.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. මෝරියවරු | A | රාමග්‍රාම |
| | 2. ලිච්ඡවීහු | B | මිථිලා |
| | 3. මල්ලයෝ | C | පාවා |
| | 4. විදේහයෝ | D | වෛශාලි |
| | 5. කෝලියයෝ | E | පිප්පලීවන |

1. AEBDC 2. BCDEA 3. CDABE 4. DABCE 5. EDCBA(.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ යොදන්න.**

21. වයඹ දිග ඉන්දියාවේ පිහිටි ප්‍රධාන ගංගාවන් වන්නේ,
1. නර්මදා 2. තප්ති 3. සින්දු 4. ගංගා 5. යමුනා (.....)

22. හරප්පා ශිෂ්ඨාචාරය පිළිබඳ ප්‍රථමවතාවට පර්යේෂණ පවත්වන ලද්දේ,
1. දයාරාම් ශානි 2. ආර්.ඩී බැනර්ජී 3. ඇලෙක්සැන්ඩර් කනිංහැම්
4. මෝටිමර් විලර් 5. වසන්ත් සින්දේ (.....)

23. 'මත්ස්‍ය න්‍යාය' ,විවාහ සබඳතා, මිත්‍ර සබඳතා, ආගමික සබඳතා ආදී විවිධ උපක්‍රම මගින් පුළුල් කරගත් ජනපදය වන්නේ,
1. අංග 2. මගධ 3. කාසි 4. කෝසල 5. වජ්ජි (.....)

24. මගධ රාජ්‍ය පාලනය කළ රාජවංශ අනුපිලිවෙළින් දැක්වෙන්නේ පහත කවර ලැයිස්තුවේද?
1. නන්ද, හර්යංක, මෞර්ය, ශිශුනාග, ශුංග
2. ශිශුනාග, හර්යංක, නන්ද, මෞර්ය, ශුංග
3. හර්යංක, ශිශුනාග, මෞර්ය, නන්ද, ශුංග
4. ශිශුනාග, හර්යංක, ශුංග, නන්ද, මෞර්ය
5. හර්යංග, නන්ද, මෞර්ය, ශුංග, ශිශුනාග (.....)

25. ක්‍රි.පූ. හයවන සියවසේ ඉන්දියාවේ බිහි වූ ෂට්ශාස්තෘවරුන් අතරින් 'භෞතික වාදය' නැමැති දර්ශනය ඉදිරිපත් කරන ලද්දේ,
1. පූර්ණ කස්සප 2. මක්ඛලී ගෝසාල 3. අජිත කේසකම්බල
4. පකුධ කච්චායන 5. සංජය බෙල්ලට්ඨිපුත්ත (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

- **අංක 26 සිට 30 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

26. පශ්චාත් වෛදික යුගයේ සමාජ තත්වයෙහි විශේෂ ලක්ෂණයක් වන්නේ,
    1. ඍග් වෛදික යුගයට සාපේක්ෂව කාන්තාවගේ තත්වය වඩා පහළ මට්ටමක පැවතීම.
    2. ආගමික චාරිත්‍ර වාරිත්‍ර සංකීර්ණ වීම.
    3. ක්ෂත්‍රියයන්ට සමාජයේ ඉහළම තැන හිමිවීම.
    4. උපත අනුව පුද්ගලයාගේ සමාජ තත්වය තීරණය වීම.
    5. දේශපාලනයෙහිලා ගෝත්‍ර ප්‍රධානතැනක් ගැනීම. (.....)

27. ඉන්දු නිම්න ශිස්ටාචාරය
    1. මුළුමනින්ම පාහේ නාගරික ලක්ෂණවලින් යුත් ශිෂ්ටාචාරයක් වීම.
    2. මෙහි ජනතාව තුළ කිසිදු පන්ති පදනමක් නොතිබූ බවට සාධක ඇත.
    3. ප්‍රධාන නගර 2ක් කේන්ද්‍ර කරගෙන මෙම ශිෂ්ඨාචාරය බිහි වී ඇත.
    4. අළුතින් සොයාගත් වාණිජ නගරය රඛීගාර්හිය.
    5. මෙම ශිස්ටාචාරය තුළ විවිධ කර්මාන්ත දක්නට ලැබිණි. (.....)

28. අලහබාද් ප්‍රශස්තිය,
    1. රටක ඉතිහාසය ගොඩනගා ගැනීමේදී සෙල්ලිපි ඉතා වැදගත්වේ.
    2. සමුද්‍රගුප්ත රජු විසින් මෙය පිහිටුවන ලදී.
    3. අශෝක රජුගේ අලහබාද් ටැම් ලිපියේ ප්‍රතිමුඛයේ කොටවා ඇත.
    4. මෙම සෙල්ලිපියෙන් සමුද්‍රගුප්ත රජුගේ යුධ ප්‍රයානයන්හි අවස්ථා 6ක් පිළිබඳ සඳහන් කරයි.
    5. ''සටන් සියයක වීරයා'' ලෙස මෙම සෙල්ලිපියේ සමුද්‍රගුප්ත රජු හැඳින්වේ. (.....)

29. නාණක මූලාශ්‍ර
    1. ඉන්දීය ඉතිහාසය හැදෑරීමේදී කාසි වැදගත් පුරා විද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස සැලකේ.
    2. රන්, රිදී, තඹ, ලෝකඩ ආදිය යොදාගත් මාධ්‍ය අනුව එකල කාසි නිකුත් කොට ඇත.
    3. බැක්ට්‍රියන් - ග්‍රීක රජවරු තිස්දෙනෙකු පිළිබඳ තොරතුරු ලැබෙන එකම මූලාශ්‍රය බැක්ට්‍රියානු ග්‍රීක කාසි වීම.
    4. කුෂාණ කාසි ග්‍රීක ශෛලියකට අනුව නිපදවා ඇත.
    5. ගුප්ත කාසි එම යුගයේ ආර්ථික, දේශපාලන, සංස්කෘතික තොරතුරු රැසක් හෙළිකරගත හැකි වීම. (.....)

30. ක්‍රි.පූ. හයවන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්වය,
    1. ගෝත්‍රිකත්වයේ සිට ස්ථාවර දේශසීමා ඇති රාජ්‍යයන් රාජාණ්ඩු හෝ සමූහාණ්ඩු ලෙස නිර්මාණය විය.
    2. ජනපද අතරින් බහුතරය රාජාණ්ඩු වීම.
    3. බිහි වූ ප්‍රධාන ජනපද සංඛ්‍යාව 16ක් විය.
    4. ප්‍රධාන රාජාණ්ඩු වූයේ මගධ, කෝසල, වජ්ජි, මල්ල, යන රාජාණ්ඩුය.
    5. මගධ රාජ්‍ය බලවත් කිරීම සඳහා මුල් පදනම දමනු ලැබූයේ බිම්බිසාර රජතුමාය. (.....)

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති A,B, C, D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝකිහිපයක් හෝ නිවැරදිය. නිවැරදිව ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
  Bසහ C පමණක් නිවැරදි නම් 2 ද,
  C සහ D පමණක් නිවැරදි නම් 3 ද,
  A සහ C පමණක් නිවැරදි නම් 4 ද,
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A හා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැදිය. |

31. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර
 A ඉන්දියානු පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබාදෙනුයේ අභිලේඛනයයි.
 B අභිලේඛන අතර සෙල්ලිපි ප්‍රධාන වේ.
 C සෙල්ලිපි ලියා ඇති ස්වරූපය අනුව ඒවා ලෙන් ලිපි, ගිරි ලිපි, පුවරු ලිපි, ටැම් ලිපි ලෙස බෙදා ඇත.
 D මෞර්ය අධිරාජ්‍යයේ ව්‍යාප්තිය ආදී දේශපාලන තොරතුරු රැසක් සෙල්ලිපිවල සටහන්ව ඇත. (.....)

32. ඉන්දියාවේ භූගෝලීය පිහිටීම.
 A ඉන්දියාවේ ආරක්ෂකයා හිමාලයා කඳුවැටියයි.
 B ඉන්දියාවේ ආසියාවේ සෙසු රටවලින් වෙන්කරන්නේ වින්ධ්‍යා කඳු වැටියයි.
 C හිමාලයා කඳුවැටියේ උසම ස්ථානය එවරස්ට් හෙවත් ගෞරි ශංකර්ය.
 D උතුරු ඉන්දියාව සහ දකුණු ඉන්දියාව වෙන් කරන භූගෝලීය පිහිටීම හින්දුකුෂ් කඳු වැටියයි. (.....)

33. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය,
 A උසස් නාගරික ලක්ෂණවලට සමානව දියුණු ආර්ථිකයක් පැවතින.
 B කෘෂි කර්මාන්තය දියුණු ලෙස පැවති බව ධාන්‍යාගාර හමුවීමෙන් පැහැදිලි වීම්.
 C ආර්ථිකයේ ප්‍රධාන අංගයක් ලෙස කර්මාන්ත පැවති බව.
 D සත්ත්ව පාලනයේදී එළුවා ප්‍රධාන වූ බව. (.....)

34. සොළොස් මහා ජනපද
 A සියලුම රාජ්‍යයන් රාජාණ්ඩු නම් විය.
 B ක්‍රි.පූ. හයවන සියවස වන විට උතුරු ඉන්දියාවේ බිහි වූ දේශපාලන ඒකක 16ක් ඉස්මතු වීම.
 C මෙසේ බිහි වූ දේශපාලන ඒකක සොළොස් මහා ජනපද ලෙස හැඳින්වීම.
 D වජ්ජි හා මල්ල රාජාණ්ඩු ලෙස ප්‍රසිද්ධ විය. (.....)

35. ඉන්දියාවේ නව ආගමික චින්තනය,
 A ජෛන ආගමේ ශාස්තෘවරයා නිගණ්ඨ පරපුරම අයත් කෙනෙකු නොවේ.
 B ගෞතම බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය ජෛන ආගමේ අදහස්වලට සම්පූර්ණ පටහැනියි.
 C බුදු දහමට ලැබුණු ජන ප්‍රසාදය හා රාජ්‍ය අනුග්‍රහය නිසා ඉන්දීයාවේ රාජ්‍ය ආගම බවට පත්විය.
 D ක්‍රි.පූ. 6 වන සියවස වන විට ආගමික දෘෂ්ඨීන් 62 ක් ක්‍රියාත්මක වූ අතර ඉන් 6ක් ප්‍රබල ලෙස නැගී ඒම දක්නට ලැබිණි. (.....)

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

- අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.

| පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 1. නිවැරදිය | වැරදිය |
| 2. නිවැරදිය | නිවැරදිය |
| 3. වැරදිය | වැරදිය |
| 4. වැරදිය | නිවැරදිය |
| 5. නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. ඍග් වෛදික යුගයේ පැවති සරල පාලන රටාව සංකීර්ණ තත්වයට පත්වීම. | රාජ්‍යත්වය පාරම්පරිකව උරුමවීමේ සම්ප්‍රදායයක් ඇතිවීම. (.....) |
| 37.භාරතයන්ගේ සටන පිළිබඳ තොරතුරු දැක්වෙන වෘත්තාන්තය මහා භාරතයයි. | මෙම සටන සිදුවූයේ හිමාලය කඳු ආශ්‍රිත ප්‍රදේශයේය. (.....) |
| 38. ක්‍රි.පූ. 3 වන සියවස තුළ ඉන්දියාවේ කැපී පෙනෙන මානසික හා අධ්‍යාත්මික පිබිදීමක් පැමිණියේය. | මගධය මෙම ප්‍රබෝධකාරී තත්වයේ කේන්ද්‍රස්ථානය විය. (.....) |
| 39. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පුරාම විවිධත්වයක් දක්නට තිබිණි. | එම විවිධත්වයට මූලික වශයෙන් හේතුවී ඇත්තේ බලවත් රජෙකු යටතේ මධ්‍යගත පාලනයක් පැවතීමයි. (......) |
| 40. මෙගස්තිනිස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථය මෞර්ය පාලනය පිළිබඳ වටිනා තොරතුරු සපයන මූලාශ්‍රයකි. | ඉන්දියානු ඉතිහාසයේ විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර හැදෑරීමේදී මෙම ග්‍රන්ථ තොරතුරු රැසක් හෙළි කරයි. (.....) |

SLGURU.LK
For Educational Purpose Only

“Today a reader, tomorrow a leader.” — Margaret Fuller

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

25A S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ..............................

# ඉන්දියා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | බයිබර් දුර්ගය | (ii) | සුලෙයිමාන් කඳු | (iii) | මොහොන්ජොදාරෝ |
| (iv) | නර්මදා | (v) | සුප්පාරක | (vi) | කල්කටා |
| (vii) | මගධය | (viii) | කාලිංගය | (ix) | මධුරා |
| (x) | පුරුෂපුරය | (xi) | උජ්ජෙයිනි | (xii) | කැම්බේ බොක්ක |

(නිවැරදිව ලකුණු කොට නම් කිරීමට ලකුණු 1 බැගින්)

## B කොටස

02. ඉන්දියානු ඉතිහාසය හැඩගැස්වීමෙහිලා දේශීය සාහිත්‍ය මූලාශ්‍රවලින් ලැබෙන පිටුවහල පරීක්ෂා කරන්න. (ලකුණු 16)

03. ඉන්දියාවේ ඉතිහාසය ගොඩ නැගීම කෙරෙහි භූගෝලීය පිහිටීම බලපෑ ආකාරය.
   (i) ඉන්දියාවේ බාහිර පිහිටීම.
   (ii) ඉන්දියාවේ අභ්‍යන්තර පිහිටීම යන අංශ යටතේ පැහැදිලි කරන්න.

04. ''ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ලෝකයේ පැරණිතම ශිෂ්ටාචාරයයි''
   (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයටඅයත් ප්‍රධාන වරාය සහ ප්‍රධාන වණිජ නගරය නම් කරන්න. (ල. 2)
   (ii) විශාල ධාන්‍යාගාරයක සහ නාන තටාකයක නටඹුන් හමුවූ ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ ප්‍රධාන නගර දෙක පිළිවෙළින් නම් කරන්න. (ල. 2)
   (iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නිර්මාපකයෙන් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 4)
   (iv) ඉහත කියමන ඇසුරෙන් ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ පරිහානිය හා බිඳ වැටීම පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 9)

05. වෛදික යුගයේ ඉන්දියාවේ ආර්ය ජනාවාස පිහිටුවීම හා ඒවායේ ව්‍යාප්තිය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 16)

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

## C කොටස

06. පශ්චාත් වෛදික යුගයේ දේශපාලන හා සමාජ ක්ෂේත්‍රවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල. 16)

07. ''ක්‍රි.පූ. 6 වන සියවස උතුරු ඉන්දියාවේදී පරිවර්තන යුගයකි.''
   (i) උතුරු ඉන්දියාවේ පැවති රාජාණ්ඩු 2ක් නම් කරන්න. (ල. 2)
   (ii) උතුරු ඉන්දියාවේ පැවති සමූහාණ්ඩු 2ක් නම් කරන්න. (ල. 2)
   (iii) මගධය අනෙකුත් ජනපද අභිබවා අධිරාජ්‍ය තත්වයට පත්වීම සම්බන්ධව කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)
   (iv) ඉහත ප්‍රකාශයට අනුව ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දේශපාලන තත්වය පිළිබඳ පරීක්ෂා කරන්න. (ල. 8)

08. ඉන්දියාවේ වර්ධනය වූ නව ආගමික චින්තාවන් පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 16)

09. පහත මාතෘකා 2ක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) ඉන්දියාවේ කඳු වැටි
   (ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නාගරික ලක්ෂණ
   (iii) ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ රාජධානි.
   (iv) ෂට් ශාස්තෘවරුන් (එක් කොටසකට ලකුණු 8 බැගින්)

SLGURU.LK

For Educational Purpose Only

“Today a reader, tomorrow a leader.” — Margaret Fuller

SLGURU.LK

Visit SLGURU.LK to download papers and notes.